www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ අයවැය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කප්පාදු ඉල්ලීම් ක්‍රියාවට දමයි

Sri Lankan budget imposes IMF austerity demands

**සමන් ගුනදාස සහ කේ. රත්නායක විසිනි**

**2010 ජුලි 3**

අඟහරුවාදා, ශ්‍රී ලංකාවේ නියෝජ්‍ය මුදල් ඇමති සරත් අමුනුගම, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ඉල්ලීම් ඉටු කරන කප්පාදු පියවර සඳහා සැලසුම් සහිතව, ප්‍රමාද වී තිබූ 2010 වසරේ අන්තර්වාරික අයවැය ඉදිරිපත් කලේය.

මහ ව්‍යාපාරිකයන් නංවාලනු වස් බදු සහන හා යටිතල පහසුකම් සැපයෙන අතර ම, අයවැය යෝජනා මගින් අයවැය හිඟය දල දේශීය නිෂ්පාදිතයෙන් (දදේනි) සියයට 9.9 සිට සියයට 8.8 දක්වා තියුනු ලෙස අඩු කෙරෙනු ඇති බව අමුනුගම කියාපෑවේය. අයවැය හිඟය කප්පාදු කෙරෙනු ඇත්තේ කම්කරුවන්ගේ හා දුගීන්ගේ වියදමිනි. එනම්, අත්‍යවශ්‍ය ද්‍රව්‍ය මත පැනවෙන බදු ඉහල දැමීම, ආන්ඩුවේ සංස්ථාවලට දෙන සහනාධාර කප්පාදුව සහ රාජ්‍ය අංශයේ සේවකයන්ගේ වැටුප් තව දුරටත් කැටි කිරීම මගිනි.

අයවැය ආදායම් ලබාගන්නා නිශ්චිත පියවර පිලිබඳ කිසිදු විස්තරයක් සම්පාදනය කර නැත. ඒ වෙනුවට, ආන්ඩුව සැලසුම් කර ඇත්තේ ගැසට් නිවේදන හරහා ප්‍රජාතන්ත්‍ර විරෝධී ලෙස බදු ඉහල දැමීමටයි.

අපනයන හා විදේශ ආයෝජන පහල වැටීමට තුඩුදුන්, ලෝක ආර්ථික කඩාවැටීම මගින් අවුලුවාලූ ගෙවුම් ශේෂ අර්බුදයක් වලකාගනු පිනිස ආන්ඩුව පසුගිය ජූලියේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ඩොලර් බිලියන 2.6ක නයක් ලබාගත්තේය. 2009 වසරේ අයවැය හිඟය දල දේශීය නිෂ්පාදිතයෙන් සියයට 7ක් දක්වා කප්පාදු කල යුතුය යන ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ඉලක්කය ජයගැනීමට ආන්ඩුව අපොහොසත් වූ බැවින් මූල්‍ය අරමුදල පෙබරවාරියේ දී නය මුදලේ තෙවන වාරිකය අත්හිටුවීය.

ආන්ඩුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කිසිදු කොන්දේසියකට යටත් වී නැතැයි අමුනුගම ප්‍රකාශ කලේය. කෙසේවෙතත්, අයවැය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කල දාට පෙර දින, ආන්ඩුව එය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත යැවූ අතර, මූල්‍ය අරමුදල නොපමාව ප්‍රමාද වී තිබූ වාරිකය නිදහස් කිරීම නිවේදනය කලේය. මූල්‍ය අරමුදලේ කොන්දේසි අනුව යමින්, ඊලඟ දෙවසර තුල දී හිඟය සියයට 6.8ට ද පසුව සියයට 5 දක්වා ද අඩු කිරීමට අයවැය යෝජනා මගින් පොරොන්දු වී තිබේ.

අයවැයට ප්‍රතිචාර දක්වමින්, මූල්‍ය අරමුදලේ නියෝජ්‍ය කලමනාකරන අධ්‍යක්ෂ නොයුකි ෂිනොහරා මෙසේ පැවසීයඃ "සැලසුම් කෙරුනාට වඩා දුර්වල 2009 වසරේ මූල්‍ය ප්‍රගතිය තිබිය දී ම, ආන්ඩුවේ 2010 අයවැය යෝජනා, ඒවා ක්‍රියාවට දැමුව හොත්, ප්‍රධාන වසයෙන්, විස්තීර්න බදු ප්‍රතිසංස්කරන හා වර්තන වියදම් සැහෙන ප්‍රමානයකින් කප්පාදු කිරීම හරහා, අතීත මූල්‍ය අත්වැරදිවලට සැලකිය යුතු ලෙස ආමන්ත්‍රනය කරනු ඇත." "පුද්ගලික ආයෝජන හා වර්ධනය දිරිගැන්වීමට" හා "ශ්‍රී ලංකාවේ ව්‍යාපාර කිරීමේ ඉහල පිරිවැය" අඩු කිරීමට ආන්ඩුවට සැලසුම් ඇති බව ඔහු තව දුරටත් කියාසිටියේ එම සැලසුම් අනුමත කරමිනි.

අයවැයට අනුව, සංගත අංශය මත කිසිදු බලැපෑමකින් තොරව, බදු එකතුව 2009 තිබූ දල දේශීය නිෂ්පාදිතයෙන් සියයට 14.5 සිට සියයට 17 දක්වා ඉහල නගිනු ඇත. "පුද්ගලික හා සංගත ආදායම් මත මෙන්ම බැංකු හා මූල්‍ය ආයතන මත පවත්නා පමන ඉක්ම වූ බදු අනුපාතික" පහල දැමීමට ආන්ඩුව ක්‍රියා කරන බව අමුනුගම පැවසීය.

"යුරෝපයේ නය අර්බුදය ගෝලීය ආර්ථිකයට වලකැපීමේ තර්ජනය මතු කලාට පසුව ආයෝජකයන් ආන්ඩුවේ මූල්‍ය තත්වය මත අවධානය යොමු කල තතු යටතේ" ආන්ඩුව "බදු ක්‍රමය සරල හා කාර්යක්ෂම කිරීමේ යෙදී සිටින" බව බ්ලූම්බර්ග් ව්‍යාපාරික වෙබ් අඩවිය වාර්තා කලේය. මෙම අටුවා ගෝලීය ආර්ථික අර්බුදයේ නව අදියර ගැන අවධානය යොමු කරයි. යුරෝපය පුරා හා ලොව වටා, මූල්‍ය වෙලඳ පොලවල් ආන්ඩුවලින් ඉල්ලා සිටින්නේ, වියදම් කප්පාදු කරමින්,

2008 මූල්‍ය අවුලෙන් පසුව ධනවාදයට ඇප දී ගලවාගැනීමේ ප්‍රතිඵලයක් ලෙස අත්විඳීමට සිදුව ඇති නය බර කම්කරු පන්තිය මත කඩාපාත් කරන ලෙසයි.

අයවැයට දින කිහිපයකට පෙර, ආන්ඩුව කිරිපිටි මිල සියයට 10කින් ද තිරිඟු පිටි මිල සියයට 16.6කින් ද ඉහල දැමූ අතර, එය පාන්වල හා පිටිවලින් තනන සෙසු නිෂ්පාදිතවල මිල ගනන් ඉහලයාමට ද තුඩු දුනි. සිගරට් හා මත්පැන් බදු සියයට 5කින් පමන ඉහල දමා තිබේ.

රාජ්‍ය අංශයේ වැටුප් කැටි කිරීම, රාජ්‍ය හා පුද්ගලික අංශවල සේවකයන්ගේ මාසික වැටුප රුපියල් 2,500කින් ඉහල දමන බවට මේ වසර මුල මැතිවරන ව්‍යාපාර තුල දී ජනාධිපති මහින්ද රාජපක්ෂ දුන් ප්‍රෝඩාකාරී පොරොන්දුව එලිදරව් කරයි. 2011 දී නව "වැටුප් ව්‍යුහයක්" ක්‍රියාවට දමන බවට අමුනුගම තවත් හිස් පොරොන්දුවක් ලබා දුනි. අතීතයේ දී මෙන්, එය පිලියෙල කිරීමට සහාය දෙන ලෙස වෘත්තීය සමිතිවලින් ඉල්ලා සිටිනු ඇත යයි ද ඔහු පැවසීය. රාජපක්ෂ ආන්ඩුවේ පැවති වසර පහක කාලය තිස්සේ, වෘත්තීය සමිති කම්කරුවන්ගේ වැටුප් අරගල මැඩීමෙහි ලා තීරනාත්මක ක්‍රියාකලාපයක් ඉටු කර තිබේ.

ආන්ඩුව රාජ්‍ය අංශයේ සේවකයන්ගේ විශ්‍රාම වැටුප් ක්‍රමයට වලකැපීමට ද සූදානම් වේ. වර්තමානයේ දී විශ්‍රාම වැටුප් සඳහා අරමුදල් දායකත්වය සපයන්නේ ආන්ඩුවයි. එහෙත් 2011 සිට අලුතෙන් සේවයට බැඳෙන අයට ද සේවය ස්ථිර කිරීමට හිමිකම් ඇති අනියම් සේවකයන්ට ද අලුතෙන් නිර්මානය කෙරෙන විශ්‍රාම වැටුප් අරමුදලකට දායක වීමට බල කෙරෙනු ඇති අතර එය පුද්ගලික අංශයට ද පුලුල් කෙරෙනු ඇත.

විදුලි බල මන්ඩලය, ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, තැපැල් හා දුම්රිය දෙපාර්තමේන්තු සහ ගමනාගමන මන්ඩලය ඇතුලු රාජ්‍ය ආයතන "වානිජ්‍යව කාර්යක්ෂම" හා ලාභ ලබන කර්මාන්ත බවට පත් කරන බවට ද අයවැය යෝජනා ප්‍රකාශ කලේය. මෙම ආයතනවලට ලැබෙන රජයේ සහනාධාර කප්පාදු කිරීම මගින් අදහස් කෙරෙනු ඇත්තේ ඉහල ගාස්තු සහ මහා පරිමානයේ රැකියා කප්පාදුවකි.

ජීවන වියදම ඉහල යමින් තිබිය දී පවා, සමෘද්ධි, පොහොර සහනාධාර සහ පෝෂ්‍ය වැඩපිලිවෙලවල් වැනි සුබසාධක ව්‍යාපෘති සඳහා කිසිදු අමතර මුදල් වෙන් කිරීමක් සිදු කොට නැත. සෞඛ්‍යය හා අධ්‍යාපනයට කෙරෙන මුලු වියදම් රුපියල් බිලියන 10කින් අඩු කර ඇති අතර මිලිටරිය සඳහා රුපියල් බිලියන 186ක් වෙන් කර තිබේ.

රාජ්‍ය නය ඉහල මට්ටමකට නැගීමට ප්‍රධාන හේතුවක් වූයේ බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහි රාජපක්ෂගේ වර්ගෝත්තමවාදී යුද්ධය සඳහා කෙරුනු දැවැන්ත මිලිටරි වියදමයි. 2009 මැයි මස එල්ටීටීඊය පරාජය කෙරුනු නමුදු, ආරක්ෂක වැය අයවැය මුලු වියදම්වලින් තවමත් සියයට 15කට වග කියයි. සිය කප්පාදු පියවරවලට එරෙහිව වැඩ කරන ජනතාවගේ ප්‍රතිරෝධය පැන නගිනු ඇත යන්න ගැන මැනවින් දන්නා බැවින් ආන්ඩුව දැවැන්ත මිලිටරි යන්ත්‍රය දිගටම පවත්වා ගෙන යයි. එමෙන්ම එය දිවයිනේ උතුරේ හා නැගෙනහිර මිලිටරි වාඩිලෑම ද ශක්තිමත් කරමින් සිටී.

ආන්ඩුව උතුරේ වන්නි කලාපයේ සිටින යුද්ධයෙන් බැට කෑ දෙමල පවුල්වලට නිවාස, පාසල්, රෝහල් හා සෙසු පහසුකම් සපයන බවට අයවැය කතාව බොරුවක් ඇද බෑවේය. එම කලාපය පුනරුත්ථාපනය කරනු පිනිස රුපියල් බිලියන ගනනක් අවශ්‍ය කෙරෙන නමුත්, එවන් මුදල් වෙන් කිරීමක් සිදු කොට නැත.

කෙසේවෙතත්, අමුනුගම, පුද්ගලික අංශයේ ආයෝජකයන්ට පහසුකම් සලසනු පිනිස රුපියල් බිලියන 300ක "මූලෝපායික යටිතල පහසුකම්" සැලසුමක් නිවේදනය කලේය. උතුර හා නැගෙනහිර ඇතුලු රටේ බොහෝ ප්‍රදේශවල ලාභ ශ්‍රම වේදිකා නිර්මානය කිරීමේ ඉලක්කයෙන් යුක්තව, මහා මාර්ග හා ආයෝජන කලාප ඉදිකිරීම මෙයට ඇතුලුත් වනු ඇත.

අයවැයෙන් විශාලම මුදල් ප්‍රමානය වෙන් කර ඇත්තේ නය ආපසු ගෙවීම සඳහා ය. නය පොලී ගෙවීම සඳහා පමනක් රුපියල් බිලියන 337ක්, නැතහොත් මුලු වියදම්වලින් සියයට 26ක් වැය වේ. ඊට අමතරව, ආන්ඩුව මේ වසරේ නය ආපසු ගෙවීම පිනිස රුපියල් බිලියන 565ක් සොයාගත යුතුය. එමගින් ආන්ඩුවේ දල නය අවශ්‍යතා රුපියල් බිලියන 980 (එ.ජ. ඩොලර් බිලියන 8.5) දක්වා ඉහල යනු ඇත.

අයවැයට අනුව, පසුගිය වසරේ සියයට 4ට කඩාවැටුනු ආර්ථික වර්ධන වේගය මේ වසරේ සියයට 6 හා 7 අතර අගයක් දක්වා වනු ඇතැයි අපේක්ෂා කෙරෙයි. එම ඉලක්කය ජය ගනු ඇති බවට දර්ශකයක් ලෙස ආන්ඩුව උපුටා දක්වන්නේ, මේ වසරේ ප්‍රථම තුන් මාසය තුල අපනයන ආදායම සියයට 7.1කින් වැඩිවීමයි. කෙසේවෙතත්, රටේ ප්‍රධානම අපනයන ද්‍රව්‍යය වන ඇඟලුම් අපනයනය සියයට 14.9කින් කඩා වැටීම මගින්, මෙම සංඛ්‍යාමය ඉලක්කයන්ගේ බිඳෙනසුලු ස්වභාවය පෙන්නුම් කෙරුනි. එම කාල පරිච්ඡේදය තුල දී ම, ආනයන බිල සියයට 39.5කින් පිම්මේ ඉහල ගියේ, වෙලඳ හිඟය ඩොලර් බිලියන 1.46 දක්වා ඉහල යවමිනි. එය වනාහි පසුගිය වසරේ එම කාල පරිච්ඡේදය තුල වෙලඳ හිඟයේ සිදු වූ වර්ධනය මෙන් සියයට 119කි.

එතෙර සේවය කරන ශ්‍රී ලාංකික කම්කරුවන්ගෙන්, ප්‍රධාන වසයෙන් මැද පෙරදිග සේවය කරන අයගෙන්, ලැබෙන ප්‍රේශන මේ වසරේ ප්‍රථම කාර්තුව තුල දී සියයට 14කින් ඉහල ගියේය. කෙසේවෙතත්, ඉහල ප්‍රේශන වෙලඳ හිඟය පියවාගැනීමට ප්‍රමානවත් නොවනු ඇති බවට අර්ථශාස්ත්‍රඥයන් උත්සුකතා පල කර ඇත.

මුදල් අමාත්‍යංශය සිදු කල සමීක්ෂනයක් ආන්ඩුවේ සර්වශුභවාදී අනාවැකි පිලිබඳව සැක පල කරයි. එය මෙසේ පිලිගනී: "බලාපොරොත්තු වූවාට වඩා පහල අගයක් දරන ගෝලීය ආර්ථික වර්ධනයේ ප්‍රතිඵලයක් ලෙස ඇති වන ගෝලීය අසමතුලිතතා ශ්‍රී ලංකාවේ භාන්ඩ හා සේවා සඳහා පවත්නා බාහිර ඉල්ලුම මත අහිතකර ලෙස බලපා හැකි අතර එය හේතු කොට ගෙන ශ්‍රී ලංකා ආර්ථිකයේ වර්ධන වේගය පහල බැසිය හැකිය." අමාත්‍යංශය මෙසේ අනතුරු අඟවයි: "ජාත්‍යන්තර වෙලඳ පොලවල බලාපොරොත්තු වූවාට වඩා ඉහල අගයක් දරන තෙල් හා වෙලඳ භාන්ඩ මිල ගනන්, ආන්ඩුවේ වියදම හා ආදායම මත බලපාන අතරම, සර්ව-ආර්ථික ස්ථාවරත්වය හා වර්ධන ඉලක්කයන් තර්ජනයට ලක් කල හැකිය."

ආන්ඩුවේ ආර්ථික පිලිවෙත මහ ව්‍යාපාරිකන් හා විදේශ ආයෝජකයන් පොහොසත් කිරීම දෙසට විවෘතව යොමු කෙරී ඇත. සිය අයවැය කතාවේ දී, අමුනුගම, ඉදිකිරීම් සිට උසස් අධ්‍යාපනය දක්වා දිවෙන ක්ෂේත්‍ර ගනනාවක ආයෝජන අවස්ථා සැපයීමේ "මාර්ග සිතියමක්" පිලිබඳව කතා කලේය. ඔහු මෙසේ ප්‍රකාශ කලේය: "මාර්ග සිතියම තුල ලකුනු කර ඇති ක්ෂේත්‍ර තුල පුද්ගලික අංශයේ ආයෝජන යෝජනාවලට ප්‍රතිචාර දක්වනු පිනිස සමස්ත රාජ්‍ය යාන්ත්‍රනයම ප්‍රතිසංවිධානය කෙරෙයි."

මෙම පිලිවෙත් ක්‍රියාවට දමනු පිනිස, රාජපක්ෂ මිලිටරි යාන්ත්‍රනය පවත්වා ගෙන යනවා පමනක් නොව, සිය දෑතෙහි වඩවඩා ආඥාදායක බලතල සංකේන්ද්‍රනය කරගැනීමේ ද යෙදී සිටී. ප්‍රධාන පන්ති ගැටුම් ඉදිරියෙන් පවතී. එහි දී වැඩ කරන ජනතාවට සිය අවශ්‍යතා ආරක්ෂා කරගත හැකි වනු ඇත්තේ, ව්‍යාපාරික ප්‍රභූ කොටස්වල නොව ජනගහනයේ අතිමහත් බහුතරයේ ප්‍රතිලාභ පිනිස සමාජවාදී පිලිවෙත් ක්‍රියාමට දමන කම්කරු-ගොවි ආන්ඩුවක් සඳහා වන අරගලයේ පදනම මත ස්වාධීනව බලමුලු ගැන්වීගැනීමෙනි.

© www.wsws.org